සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

14-02-2024
Learning Resource Centre R
De Mazenod College
Kadana
08318

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ………………………………… විභාග අංකය / சுட்டிலக்கம் / Index No. …………………

## I කොටස

- අංක 1 - 10 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ''කර්තෘගේ නම සඳහන් නොකළ ද භාෂාව හා ශෛලිය සැලකිල්ලට ගත්විට එකම ලේඛකයෙකු බව තහවුරුවේ. මෙම ලේඛකයා නම්,
    1. ශු. මාක් තුමා ය. 2. ශු. ලූක් තුමා ය. 3. ශු. ජොහාන් තුමා ය. 4. ශු. මතෙව් තුමා ය.

02. සමිඳුනි ඔබ පොරොන්දු වූ ලෙසට දැන් ඔබ දාසයාට, ශාන්ත සිතින් යාමට නිදහස දී ඇත. මෙලෙස ප්‍රකාශ කළේ,
    1. අන්නා දිවැසිවරිය යි. 2. ජේසුස් වහන්සේ යි.
    3. ස්තේපන් තුමා යි. 4. සිමියොන් නම් බැතිමතා යි.

03. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව මගින් ජේසුස් වහන්සේ අපට උගන්වන්නේ,
    1. බැගෑපත්ව යාච්ඤා කළයුතු බවයි.
    2. නිහතමානීව විශ්වාසයෙන් යාච්ඤා කළයුතු බවයි.
    3. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළයුතු බවයි.
    4. පිරිසිදු සිතින් යාච්ඤා කළයුතු බවයි.

04. ධනයට හා ලෞකික දේවලට වහල් නොවී ඒවා වගකීමෙන් යුතුව පරිහරණය කිරීමට අප උනන්දු වියයුතු බව ඉගැන්වෙන්නේ,
    1. පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවෙනි.
    2. මිදිවත්ත හා සේවකයන් පිළිබඳ උපමාවෙනි.
    3. ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙනි.
    4. වියළි අත්තික්කා ගස පිළිබඳ උපමාවෙනි.

05. ජේසුස් වහන්සේට ''එම්මානුවෙල්'' යන නම තබන බව ප්‍රකාශ කරන්නේ,
    1. යෙසායා දිවැසිවරයා ය. 2. එසකියෙල් දිවැසිවරයා ය.
    3. නාතාන් දිවැසිවරයා ය. 4. ජෙරමියා දිවැසිවරයා ය.

06. ස්නාවක ජොහාන්තුමා පොළගුන් ලෙස දුටුවේ,
    1. බදු අයකරන්නන්ව යි. 2. ජුදා නායකන්ව යි.
    3. සාමාන්‍ය ජනතාව යි. 4. සෙබළුන්ව යි.

07. ''ස්නාවක ජොහාන්ගේ හිස තැටියක ලා මෙහිදී මට දුන මැනවැ'' යි හෙරෝදියස්ගේ දුව පැවසූ විට අතිශයින් ශෝක වූයේ,
    1. සකරියස් තුමා ය. 2. ජේසුස් වහන්සේ ය.
    3. හෙරෝද් ඇන්ටිපස් ය. 4. එළිසබෙත් තුමී ය.

08. A - ජේසුස් වහනසේ සැබෑ දේවපුත්‍රයා බව පෙන්වාදීම
B - දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීම
C - දේව අභිමතයට මිනිස් සමාජය නතුවීම
D - ජේසුස් වහන්සේගේ බලය ජනතාවට පෙන්වාදීම
ඉහත ප්‍රකාශන අතරින් දේවරාජ්‍යයය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඇතුලත් වරණය වන්නේ,
1. A හා D ය. 2. A හා B 3. B හා D 4. B හා C

09. ශාරීරික හා මානසික රෝගවලින් පෙළෙන අය වෙනුවෙන් අප,
1. ඔවුන් ගැන සොයා බැලිය යුතුය. 2. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතුය.
3. ඔවුන්ට අවශ්‍ය බෙහෙත් ලබාදිය යුතුය. 4. ඔවුන්ව රෝහල් වෙත යොමුකළ යුතුය.

10. "යදම්වලින් ද විලංගුවලින් ද බැඳ ඔහු මුර කරන ලද්දේය." මෙම ප්‍රකාශය තුළ ඔහු යනුවෙන් සඳහන් වන්නේ,
1. ක්‍රිස්තුන් වහන්සේ ය. 2. ජෙරමියා දිවැසිවරයා ය.
3. අශුද්ධාත්මාවේශ වූ මිනිසා ය. 4. ජාකොබ් තුමාය.

11. පන්දහසකට කෑම දීමේ ප්‍රාතිහාර්යයේදී එක් කණ්ඩායමකට අයත් වූ සංඛ්‍යාව කොපමණද?
1. 50 දෙනා බැගිනි 2. 100 දෙනා බැගිනි 3. 150 දෙනා බැගිනි 4. 200 දෙනා බැගිනි

12. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නුසුදුසු ලෙස වැළඳීම සම්බන්ධයෙන් ශු පාවුලුතුමා දෝෂාරෝපණය කරන්නේ,
1. එපීසවරුන්ට ය. 2. කොරෙන්ති වරුන්ට ය. 3. ගලාතිවරුන්ට ය. 4. තෙසලෝනිවරුන්ට ය.

13. සාමාරියයන් පිට ශුද්ධාත්මයාණන් ලැබෙන ලෙස අත්තබා යාච්ඤා කළේ,
1. පේදුරුතමා හා පාවුළුතුමා ය. 2. ජොහාන්තුමා හා ජාකොබ්තුමා ය.
3. පේදුරුතුමා හා ජොහාන්තුමා ය. 4. ජාකොබ්තුමා හා පාවුළු තුමා ය.

14. විජාතික වත් පිළිවෙත් ඉටු කිරීමට මවට සහ දරුවන් හත්දෙනෙකුට බල කරන ලද කථාන්තරය සඳහන් වන්නේ,
1. I මකබි ග්‍රන්ථයේ ය. 2. II රාජාවලිය ග්‍රන්ථයේ ය.
3. I සාමුවෙල් ග්‍රන්ථයේ ය. 4. II මකබි ග්‍රන්ථයේ ය.

15. දේව නාමය උච්චාරණය කළ යුත්තේ,
1. විශ්වාසයෙන් හා බැහැපත්කමෙනි. 2. භක්තියෙන් හා ගෞරවයෙනි
3. ගෞරවයෙන් හා ප්‍රේමයෙනි. 4. විශ්වාසයෙන් හා භක්තියෙනි

16. "කොහෙත්ම නොදිවුරන්න ........................ දෙවියන් වහන්සේගේ සිංහාසනය බැවින්, ඒ නමින් වත් ........................ දෙවියන් වහනසේගේ පා පුටුව බැවින් ඒ නමින්වත් නොදිවුරන්න." මෙහි හිස්තැන්වලට ගැලපෙන නිවැරදි පිළිතුර වන්නේ,
1. ස්වර්ගය හා පොළොවයි 2. අහස හා පොළොව යි
3. වළාකුළු හා සාගරය යි 4. දේදුන්න හා තාරකා යි

17. සෑම යාමයකදී ම දෙවියන් වහනසේට ප්‍රශංසා කිරීම යාම යැදුමේ පරමාර්ථය යි. මෙයට හේතුව වන්නේ,
1. සියල්ල දෙවියන් වහනසේ සතු නිසා ය. 2. මැවුම්කරුවාණන් දෙවියන් වහන්සේ නිසා ය.
3. එය අපගේ යුතුකම හා වගකීමක් නිසා ය. 4. කාලය දෙවියන් වහන්සේට අයිති නිසා ය.

18. පූදසුන සූදානම් කිරීමේ පිළිවෙත ආරම්භ වන්නේ,
1. පඬුරු පෙරහැරෙනි 2. ආරම්භක ගීතිකාවෙ නි
3. පළමු දේව ප්‍රකාශයෙ නි 4. විශ්වාසකයින්ගේ යැදුමෙ නි

19. කිතුනු ජීවිතය හා බැඳි පවතින විශ්වාසයේ ක්‍රියාවලියකි
1. ශුද්ධ වූ ධාතුවලට ගරු කිරීම. 2. බාරහාර ඔප්පු කිරීම.
3. දේව ආශිර්වාදය ලබාගැනීම. 4. පදක්කම් පැළඳීම

20. සැඳෑ යාම යැදුමට පූර්ණ වශයෙන් හා අර්ථාන්විතව අපට, ඒකාබද්ධ විය හැකි අවස්ථාවක් වන්නේ,
1. මීසමේ සන්ධ්‍යා මෙහෙයේදී ය. 2. ඉරුදින දිව්‍ය පූජාවේදී ය
3. දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයේදී ය. 4. සිකුරාදා දින දිව්‍ය පූජාවට සහභාගී වීමෙන් ය

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. i. ලුක් සුභාරංචියේ ඇතුළත් ගිත හතර නම් කරන්න. (ලකුණු 04 යි)
ii. ස්නාවක ජොහාන්තුමා අයකැමියන්ට හා හමුදා නිළධාරීන්ට දුන් උපදෙස් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 04 යි)
iii. ප්‍රාතිහාර්යය අත්දැකීමට නම් අපතුළ තිබිය යුතු ගුණාංග දෙකක් නම් කරන්න.
iv. පාස්කු ඉරුදින අපෝස්තුළුවරුන්ට ශුද්ධාත්මයාණන් දානය කළ ආකාරය ජොහාන් ශුභාරංචිය අනුව සඳහන් කරන්න. (ලකුණු 04 යි)

02. i. ශු. පාවුලුතුමාගේ ධර්මදූත චාරිකාවලට ලුක් තුමා ද සහභාගී වූ බව සඳහන් වන නව ගිවිසුම් ග්‍රන්ථය නම් කරන්න. (ලකුණු 02 යි)
ii. ශු. ලුක්තුමා පමණක් සඳහන් කරන උපමා තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)
iii. ඔබ ජීවත්වන පාසල් පරිසරය තුළ දේව වචනය ප්‍රචලිත කිරීමට ඔබට කළහැකි ක්‍රියාකාරකම් 6 ක් ලියන්න. (ලකුණු 06 යි)

03. i. ''මාගේ අසල්වැසියා කවරෙක්ද'' යි ජේසුස් වහන්සේගෙන් ඇසුවේ කවුද? (ලකුණු 02 යි)
ii. දිව්‍ය සත්ප්‍රසාදීය පූර්ව සලකුණු තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)
iii. රෝගීවූ අයෙකුට සුවය ඉල්ලා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ කිවහැකි යාච්ඤාවක් ලියන්න. (ලකුණු 06 යි)

04. i. ධනයට ලොල්වීමට එරෙහිව ජේසුස් වහන්සේ වදාළ උපමාකථාව නම් කරන්න. (ලකුණු 02 කි)
ii. ජොහාන් ශුභාරංචියට අනුව උත්ථාන වූ ජේසුස් වහන්සේ දර්ශනය වූ අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 03 කි)
iii. ඉරුදින දිව්‍ය පූජාවට භක්තිවන්තව සහභාගීවීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග හයක් ලියන්න.(ලකුණු 06 කි)

05. i. ''දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ'' යන විශ්ව ලේඛනය නිකුත් කරන ලද ශුද්ධෝත්තම පියතුමා නම් කරන්න. (ලකුණු 02 කි)
ii. දේව වන්දනාවේ ප්‍රධාන අංග තුන නම් කරන්න. (ලකුණු 03 කි)
iii. දිව්‍ය පූජාවේ අවසන් පැතුම වන ''යන්න සාමය ගෙන යන්න'' යන කිතුවදන ආරක්ෂා කිරීමට ඔබට කළහැකි ක්‍රියාකාරකම් 06 ක් ලියන්න. (ලකුණු 06 කි)

6. i. ගලීල ප්‍රදේශයට අයත් ජේසුස් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ නගර දෙකක් නම් කරන්න. ලකුණු 02 කි)
ii. පූජා ප්‍රසාදි තුමාට අභිවෘද්ධි ආලේපනය දානය කිරීමේ බලය හිමිවන විශේෂ අවස්ථා තුන නම් කරන්න. (ලකුණු 03 කි)
iii. අභිවෘද්ධී ආලේපනය ලැබූවකුගේ යුතුකම් හයක් (6) පෙන්වා දෙන්න. (ලකුණු 06 කි)

7. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න
i. ලුක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම්
ii. ස්නාවක ජොහාන් තුමා
iii. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය
iv. සාන්තුවර බැතිය (ලකුණු 5.5 × 2 = 11)